**ඇමරිකන් එක්සත් ජනපද  තානාපති කාර්යාලය**

කොළඹ


# ප්‍රවෘත්ති නිවේදනය


මහජන කටයුතු අංශය

දුරකථනය:  +94 (11) 249-8100 ෆැක්ස්: +94 (11) 244-9070

විද්‍යුත් තැපැල: BaughmanBJ@state.gov වෙබ්: http://lk.usembassy.gov



නිවේදන අංක: 20191216


## එක්සත් ජනපදය ශ්‍රී ලංකාව පුරා ඉංග්‍රීසි ගුරුවරුන්ගේ කුසලතා ගොඩනංවයි

**කොළඹ, 2019 දෙසැම්බර් 16**: එක්සත් ජනපද තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකාව පුරා ගුරුවරුන් 40 දෙනෙකුට දෙසැම්බර් 7 සහ 8 යන දෙදින තුළ කොළඹ දින දෙකක ගුරු පුහුණුවක් සඳහා සත්කාරකත්වය සපයන ලදී. එක්සත් ජනපද තානාපති කාර්යාලයෙන් අරමුදල් සපයන ක්ෂුද්‍ර ශිෂ්‍යත්ව වැඩසටහනක් වන ඇක්සෙස් වැඩසටහන යටතේ සිසුන්ට ඉංග්‍රීසි සහ නායකත්ව කුසලතා වසර දෙකක් උගන්වනු ලැබේ. එක්සත් ජනපදයේ ඉංග්‍රීසි භාෂා විශේෂඥයින් විසින් පුහුණුව මෙහෙයවන ලද අතර එයට විවේචනාත්මක චින්තනය, නායකත්ව කුසලතා, ප්‍රජා සේවය, පුද්ගලික සංවර්ධනය සහ එක්සත් ජනපද සංස්කෘතිය සහ සාරධර්ම පිළිබඳ පාඩම් ඇතුළත් විය. ඇක්සෙස් ගුරුවරුන් ඔවුන්ගේ හැකියාවන් පෝෂණය කරමින් අනාගත අධ්‍යාපනික හා රැකියා අවස්ථා සඳහා සිසුන් සූදානම් කරයි.

“වැඩි වැඩියෙන් අන්තර් සම්බන්ධිත ගෝලීය වෙළඳපලකට සහභාගී වීමට අවශ්‍ය මෙවලම් සිසුන්ට ලබා දීමෙන් ඔවුන්ට හොඳ වැටුප් සහිත, ප්‍රගුණිත රැකියා ලබා ගැනීමට සහ තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීමට ශ්‍රී ලංකාවට හැකි වේ” යැයි එක්සත් ජනපද තානාපතිනී ඇලයිනා ටෙප්ලිට්ස් පැවසීය. “ඉදිරි පරම්පරාවේ ශ්‍රී ලාංකික නායකයින්ට අභියෝගයන්ට මුහුණ දීමට සහ ඉදිරියේ ඇති අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීමට වඩා හොඳින් සූදානම් කිරීමට ගුරුවරුන්ට මෙම පුහුණුව උපකාරී වේ.”

2004 දී ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද ඇක්සෙස් වැඩසටහන මඟින් මූලික වශයෙන් වයස අවුරුදු 13 ත් 20 ත් අතර දීප්තිමත්, ආර්ථික ගැටළුවලට මුහුණ දී සිටින සිසුන්ට ඉංග්‍රීසි භාෂා කුසලතා  ලබා ගැනීමට පදනමක් සපයයි. ඇක්සෙස් වැඩසටහන් මඟින් ඉංග්‍රීසි භාෂා කුසලතා වර්ධනය වන අතර එමඟින් වැඩසටහන සම්පූර්ණ කරන සිසුන්ට පුළුල් පරාසයක රැකියා සහ අධ්‍යාපන විකල්ප අතරින් තෝරා ගැනීමට හැකිවේ. මෙම වැඩසටහනට සහභාගිවන්නන්ට එක්සත් ජනපදයේ අනාගත හුවමාරු සහ අධ්‍යයන  කටයුතු සඳහා තරඟ කිරීමට සහ සහභාගී වීමට හැකියාව ලැබේ. ශ්‍රී ලංකාව පුරා ඇක්සෙස් මධ්‍යස්ථාන දහයක් ඇති අතර ඒවායේ වැඩ කරන ගුරුවරුන්ට රට තුළ සහ විදේශයන්හි පුහුණුව ලැබේ.